# 10 ශ්‍රේණිය

# ඉතිහාසය

## ඒකකය 4

## ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

කියවීම් පත්‍රිකාව









ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# පැරණි ශ්‍රී ලංකාවේ පාලනය

## මූලික ලක්ෂණ

- රාජාණ්ඩු පාලනයක් පැවතීම
- පාලනයේ ප්‍රධානියා රජු වීම
- පාලනය හාසම්බන්ධ ප්‍රධාන ආයතන (කාර්යයන් ) තුනක් පැවතීම

| ආයතනය | සිදුකරන ලද කාර්යය | අතීතයේ හැඳින් වූ අයුරු | වර්තමානයේ දී හඳුන්වන අයුරු |
|---|---|---|---|
| ව්‍යවස්ථාදායකය | නීතිරීති සම්පාදනය | බුද්ධන්නේහෙළ සෙල්ලිපිය- එක්තැන්සමිය | පාර්ලිමේන්තුව |
| විධායකය | නීතිරීති ක්‍රියාත්මක කිරීම | බුද්ධන්නේහෙළ සෙල්ලිපිය- එක්තැන්සමිය | කැබිනට් මණ්ඩලය |
| අධිකරණය | යුක්තිය පසිදලීම | සභාව - ''සභායෙන් ආ මැණින්ගමු උදහි ඉසා නිකවැලි සෙනු ඉසා''<br><br>මැදිරිගිරිය සෙල්ලිපිය (ලේකම්වරයාටද අධිකරණබලතල තිබූ බව) (මහලේ කස්බා) | අධිකරණ පද්ධතිය |

## පැරණි ප්‍රාදේශීය පාලනය හා සම්බන්ධ තොරතුරු

වල්ලිපුරම් රන්පත් ලේඛනය - ප්‍රත්‍යන්ත ප්‍රදේශ පාලනය කිරීමට මධ්‍යම රජයේ නියෝජිතයින් පත් කොට තිබූ ආකාරය



කළුදියපොකුණ සෙල්ලිපිය - ගම් දහයක් නියෝජනය වන පරිදි ඒවායේ ප්‍රධානීන්ගෙන් සමන්විත එම මණ්ඩලය (දසගම් මණ්ඩලය )

## පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට පාලකයන් ගත් ක්‍රියාමාර්ග

- 'වෙජ්ජසාලා' හෙවත් රෝහල් කරවීම
- වෛද්‍යවරු පත්කිරීම (වෙජ)
- බුද්ධදාස රජතුමා (ක්‍රි.ව 340-368) - රෝහල් ඉදි කිරීම

- ❖ පස්වන මහින්ද රජතුමා (ක්‍රි.ව. 982-1029) - ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත්වල පිහිටුවා තිබූ රෝහල්වලට අවශ්‍ය සියලුදේ ලබාදීම
- ❖ හතරවන කාශ්‍යප රජතුමාගේ (ක්‍රි.ව. 898 -914) - උණ රෝගය වැළඳුණු රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා 'උපසග්ගරෝගනාස' නම් රෝහල් ඉදිකරීම
- ❖ පළමු වන උපතිස්ස රජතුමා (ක්‍රි.ව. 365-406) - මාතෘ නිවාස ඉදිකිරීම ( 'පසවන්තිනාම සාලා' )
- ❖ පණ්ඩුකාභය රජු - සොත්ථිසාලා (මාතෘ නිවාස ඉදිකරීම )

## විදේශීය සබඳතා

- ❖ පළමු වන ගජබාහු රජතුමා (ක්‍රි.ව. 114-136) - පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වීම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම
  භාතිකාභය රජතුමා (ක්‍රි.පූ 22 ක්‍රි.ව 7) - (රුවන්වැලි සෑයට පූජාවක් පැවැත්වීමට අවශ්‍ය වූ වීදුරු පබළු රැගෙන ඒම සඳහා)
- ❖ හය වන අග්ගබෝධි රජු - විසි වතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන්
- ❖ පළමු වන විජයබාහු රජතුමා (ක්‍රි.ව1070 - 1110) - තිලෝකසුන්දරී නම් වූ කාලිංග වංශික කුමාරිකාව විවාහ කර ගැනීම
- ❖ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකු සමග විවාහ වීම
- ❖ පළමු වන විජයබාහු රජතුමා විසින් පොළොන්නරුවේ පිහිටි දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර හමුදාව පත් කිරීම
- ❖ ස්ලාමීය රජු සමග තෑගි හුවමාරු කරගැනීම - අල්-බලසූරිගේ වාර්තා

## පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකය

ලංකාවේ පැරණි සමාජයේ වාසය කළ බොහෝ ගැමියන්ගේ ප්‍රධාන ජීවන වෘත්තිය වූයේ ගොවිතැන යි. සතුන් ඇති කිරීම හෙවත් පශු පාලනය ද ගොවිතැන් කටයුතුවලට ම තදානුබද්ධව පවත්වා ගෙන ගිය කටයුත්තකි. ගොවිතැන් කටයුතු ආකාර දෙකකට සිදු කෙරිණි. ඉන් පළමුවැන්න හේන් ගොවිතැන යි. දෙවැන්න මඩ ගොවිතැන හෙවත් කුඹුරු ගොවිතැනයි. මේ අතරින් වඩාත් පැරණි හේන් ගොවිතැන බව ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් තහවුරු කරයි. බුත්සරණ නම් සාහිත්‍ය කෘතියේ සෙහෙන් යනුවෙන් ද සිංහල උම්මග්ග ජාතකයේ සේන් යනුවෙන් ද සෙල්ලිපිවල 'පිටිබිම් යනුවෙන් ද හඳුන්වා දී තිබෙන්නේ පැරණි කාලයේ තිබූ හේන් ය.

හේන් වගාව යනු ගොඩ ගොවිතැනකි. තමන්ට අවශ්‍ය ප්‍රමාණයේ ධාන්‍ය සහ එළවළු වවා ගැනීමට ප්‍රමාණවත් තරමේ ඉඩම් කොටසක් මහකැලෑවකින් වෙන් කොට ගෙන එය කපා ගිනි තැබීමෙන් හේනක් සකස් කර ගනු ලැබේ. මෙහි දී විශාල ගස් කපා නොදැමීමට වග බලා ගැනේ. මූලික වශයෙන් එළිපෙහෙලි කර ගත් කැලෑ කොටස ගිනිතැබීමට පෙර සියලු සතුන්ට ඉන් ඉවත් වන ලෙස ශබ්ද නගා කෑ ගැසීම සිදු කරන්නේ හේන අයත් ගොවියා විසිනි.අලුතින්

ගිනිතබා ගත් හේනක් හඳුන්වන්නේ නවදැලි හේන නමිනි. එවැනි හේන් ඉතා සරුසාර ය. නවදැලිසේන යන යෙදුම සද්ධර්මරත්නාවලියේ ද යෙදී තිබේ. ශ්‍රී ලංකාවේ ඇතැම් පළාත්වල නවදැලි හේන යන යෙදුමට වෙනත් තේරුමක් දී තිබේ. කුරක්කන්, කොල්ලු, උඳු, මුං, ඉරිඟු, මෑ, තණහාල්, අසමෝදගම්මිල අමු යන පැළෑටි නවය දලු ලා සරුවට වැවුණු හේන් නවදැලි හේන් යනුවෙන් හැඳින්වෙන බව ඉන් කියැවේ. කාලයක් අතහැර දමා යළිත් වගා කිරීම අරඹන හේන් හැඳින්වීමට 'කනත්ත යන වචනය භාවිත කරන්නේ අනුරාධපුර පළාතේ ගැමියන් ය. හේන් වගාවේ දී අනුගමනය කෙරෙන සාමාන්‍ය ක්‍රමය වූයේ වරක් දෙවරක් වගා කළ හේන ඉන් පසු අතහැර දැමීම යි. කාලයක් එසේ අතහැර දමා තිබීමෙන් එතැන යළිත් කැලෑව හට ගනී. එනිසා පැරණි හේන් වගාව කිසිවිටෙකත් පරිසරයට අනිසි බලපෑමක් ඇති නොකළේ ය.හේන්වල වගා කරන ලද දේ අතර උඳු, මෑ, මුං, කුරක්කන්, ඉරිඟු, තල, අමු, අබ, දුරු, තණහාල් යන ඇට වර්ග ද කරබටු, තිබ්බටු, වම්බටු, අළුපුහුල් සහ වට්ටක්කා යන එළවළු වර්ග ඇල් වී වර්ග සහ අල වර්ග උක්ගස් සහ කපු ද විය. වගා කරන ලද්දේ ඒවාට ම වෙන් වූ හේන්වල ය. ඒ කාලයේ රටට අවශ්‍ය වූ රෙදි සහ හකුරු නිපදවීමට ප්‍රමාණවත් තරමින් කපු වගාව සහ උක් වගාව මෙරට දියුණු වී තිබිණි. වැටුප් ලබමින් උක් කර්මාන්තයේ යෙදී සිටි කම්කරුවන් ගැන වංසකථාවල සඳහන්ව තිබේ. ඉතිහාසයේ දීර්ඝකාලයක් තිස්සේ රටට අවශ්‍ය හකුරු රට තුළම නිපදවා ගැනීමට අපේ මුතුන්මිත්තෝ සමත් වූහ. ක්‍රිස්තු වර්ෂයෙන් දහසයවන සියවස වන තුරු මෙරටට සීනි ආනයනය නොකළ බව විද්වත්හු පෙන්වා දෙති.හේනක් කොටන්නේ තමන් වාසය කරන නිවසට තරමක් ඈත ප්‍රදේශයක බැවින් හේනේ අස්වැන්න ලබා ගන්නා තුරු ගොවියෝ හේනේ ඉදි කරන ලද පැල්පතක තාවකාලිකව ලැගුම් ගනිති. හේන වනසතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට හේන වටා ඉදි කරන ලී වැට හඳුන්වන්නේ 'දඬුවැට' යන නමිනි. හේනේ උස් ගසක ඉදි කරන කුඩා පැල්පත හැඳින්වෙන්නේ 'පැල නමිනි. රාත්‍රී කාලයට හේනට පැමිණෙන සතුන්ගෙන් තම හේන ආරක්ෂා කර ගැනීමට ගොවියා රැය පහන් කරන ලද්දේ මෙම පැලේ ය.හේන් වගා කිරීම වෙනුවෙන් ඇතැම් රජවරුන්ගේ කාලවල දී බදු අය කර ගෙන තිබේ. කැති අඩ, කෙටූ කනබ අය යනුවෙන් සෙල්ලිපිවල හඳුන්වා දී තිබෙන්නේ එවැනි බදු වර්ග දෙකකි. පොළොන්නරුවේ රජ කළ නිශ්ශංක මල්ල රජතුමා (ක්‍රි.ව 1187 -1196) එම බදු වර්ග දෙක අහෝසි කළ බව එරජු විසින් කරවන ලද සෙල්ලිපිවල සඳහන් වේ.පුරාණ කාලයේ ජනගහනය අධික නොවුයෙන් හේන් වගාව සිය ජීවන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වෘත්තියක් විය. මඩ ගොවිතැනක් ලෙස වී වගාව ආරම්භ වුයේ වැඩිවන ජනගහනයට අවශ්‍ය කරන ආහාර වැඩිවැඩියෙන් නිපදවීමට ය.

# සත්ත්ව පාලනය

- ප්‍රධාන වූයේ ගව පාලනය යි.
- ගවපාලනයේ යෙදුණු පිරිස් සඳහා ම වෙන් වූ ගෝපාලගම් ගැන සෙල්ලිපිවලත්

  අන් සාහිත්‍ය මූලාශ්‍රයවලත් සඳහන් ය
- හතර වන කාශ්‍යප රජතුමා විසින් කොට'වන ලද සෙල්ලිපියක කිරිගෙරි යන පදය දකින්නට ලැබීම - කිරි ලබා ගැනීම සඳහා ඇති කරන ගවයින්
- ගෘහිණියක් එළදෙනකගෙන් කිරි දෝවනය කරන ආකාරය පෙන්වන කදිම කැටයමක් සීගිරියේ පිහිටි නාගපබ්බ විහාරය නමින් හැඳින්වෙන පුරාණ ස්තූපයේ ධාතුගර්භයේ තැන්පත් කර තිබූ මහාමේරු ගලේ කැටයම් කර තිබීම

# කර්මාන්ත

- මුතුගල්ල සෙල්ලිපිය - මජ්ජිම නම් කම්මල්කරුවකු ගැන තොරතුරු
- මණ්ඩගල සෙල්ලිපිය - තුලදර සුමන නම් රන් කරුවෙකු පිළිබද තොරතුරු
- වේගිරිය දේවාලය අසල සෙල්ලිපිය - දටික සුමන නම් වූ ඇත්දත්

  ශිල්පියකු ගැන තොරතුරු සඳහන් වීම
- වෙහෙරකෙම සෙල්ලිපිය - රෙදි විවීමේ කර්මාන්තය පිළිබඳ තොරතුරු

# වෙළෙඳාම

- අනුරාධපුර නගරයේ දකුණු දොරටුව අසල කාළසුමන නමින් හැඳින්වූ වෙළෙඳපළක් තිබූ බවට සාහිත්‍ය මූලාශ්‍රයන් හි තොරතුරු ඇතුළත්ව තිබීම
- සීගිරියේ බටහිර ජලඋද්‍යානයේ තිබෙන සෙල්ලිපියක 'අබල වපර' නමින් හැඳින්වෙන

  පුද්ගලයෙකු ගැන සඳහන් වීම - සියඹලා වෙළෙන්දෙක්
- වෙළෙන්දෝ සමූහ වශයෙන් සංවිධානය වී කටයුතකිරීම - 'පූගය' හෝ 'නියමස්ථාන' නමින් හඳුන්වා ඇත
- වෙළෙඳාමේ නියුක්ත වූ පිරිස් 'වණිජ' හෝ 'වාපර' යන නමින් හඳුන්වා තිබිම
- හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මණ්ඩගල නම් ස්ථානයේ තිබෙන සෙල්ලිපියක සුමන නම් වෙළෙන්දකු විසින් එලෙස පූජා කරන ලද ගල්ගුහාවක් ගැන සඳහන් වීම
- මහාග්‍රාමයේ සිට අනුරාධපුරයට පැමිණි සුරනිමල නම් තැනැත්තෙකු වෙළෙඳපොළකින් සුවඳ විලවුන් මිල දී ගත් බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වීම
- සොරබොරවැව ටැම් ලිපියේ හෝපිටිගම වෙළඳපොළහි පාලනය සම්බන්ධයෙන් පැනවූ නීති සඳහන්කර ඇත

- ❖ වෙළඳපොළට පැමිණෙන කරත්තවලින් මිස වෙළඳපොළ පසුකොට ගෙන යන කරත්තවලින් බදු අය කර ගැනීම නොකළ යුතු ය
- ❖ හිරුඑළියෙන් ආවරණය
- ❖ වන පරිදි මඩුවක් යට පමණක් බුලත් වෙළෙඳාම් කළ යුතු ය
- ❖ පොහොය දිනවල වෙළෙඳාම් නො කළ යුතුය

- ලංකාවේ ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළෙඳ සංවිධාන - නානාදේසී, වලඤ්ඤියාර්, අයින්නුරුවර් ( නානාදේසී වෙළෙඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාවක් හම්බන්තොටින් සොයා ගෙන තිබේ. )
- බෝවත්තේගල සෙල්ලිපිය - 'කබොජ මහ පුගිය' යන යෙදුම දක්නට ලැබේ ( එහි සඳහන් වන්නේ කාම්බෝජවරුන්ගේ මහා වෙළෙඳ සංවිධානයක් පිළිබඳවය )

## අතීතයේ මෙරට පැවති වෘත්තීන්

- ▪ ආචාර්යවරුන් ලෙස පැරණි ලේඛන වල හඳුන්වා ඇත.
- ▪ ඔවුන් ශිල්ප ශාස්ත්‍රවල නිපුණ පුද්ගලයින් විය.
- ▪ පහත සඳහන් ආචාර්යවරු එකල විය.
- ● හස්ති ආචාර්ය - ඇතුන් හීලෑකල
- ● අශ්ව ආචාර්ය - අශ්වයින් පිටයෑම පුහුනු කරන
- ● දුනු ආචාර්ය - දුන්නෙන් විදිම පුහුණු කරණ

## වෛද්‍ය වෘත්තීය

- ▪ අනුරාධපුරයේ මුල් අවදියේදී ඉතා ඉහලින් අගය කළ වෘත්තයයක් වෙයි.
- ▪ වෙජ යනුවෙන් හඳුන්වා ඇත.
- ▪ ඇතැම් අය මහවෙඳනා යනුවෙන් හඳුන්වා ඇත.

## විවිධ ශිල්පීන්

- ▪ චිත්‍ර ශිල්පීන් , නැට්ටුවන් , කවියන් ආදිය විය.
- ▪ "චිතකර" සහ "ලපන" යන පද සිත්තරුන් සඳහා යොදාගෙන ඇත.

උදා- හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැට්ටුක්කන්ද ප්‍රදේශයේ ලපන තිස්ස යනුවෙන් ශිල්පියෙක් හඳුන්වා ඇත.

- ▪ "කවි" යනුවෙන් කවීන් හඳුන්වා ඇත.

උදා - ලපන තිස්සගේ පුත්‍රයා කවියෙක් බව ඉහත නැට්ටුක්කන්ද ලිපියේ දැක්වෙයි.එම කවියාගේ නම සංජය ලෙස යොදාගෙන ඇත.

## අතීතයේ මෙරට සංස්කෘතිය

- ▪ මිහිඳු හිමියන් මෙරටට බුදු දහම හඳුන්වා දුන්නේය.
- ▪ අනුරාධපුරයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලාට ලෙන් **1600** ක් පමණ පූජාකර ඇත.
- ▪ එම ලෙන පිරිසිදු කර කටාරමට පහලින් බ්‍රාහ්මී අක්ෂර වලින් ( සිංහල ප්‍රාකෘත ) එය පූජාකල

පුද්ගලයාගේ විස්තරය සටහන් කර ඇත.
■ වෙස්සගිරිය , මිහින්තලය , රිටිගල , සීගිරිය ආදී ස්ථාන වල පිහිටා ඇත.
උදා - "පරුමක ගුත පුත පරුමක සුමනහ ලෙණෙ අගත අනගත චතුදිස සගස"
ප්‍රධානියෙකු වූ ගුත්තගේ පුත්‍රයා වූ ප්‍රධානි සුමන විසින් මෙහි ආවාවූද නොආවාවූද සතර දිසාවේ සංඝයාට පූජාකරන ලදී.
■ වර්ච්චි බිත්ති , ඉලුක් , පන් වැසූ වහලක් සහිත කුඩා පන්සල් ඉදිකර ඇත.
■ මේවා "පණ්ණශාලා "ලෙස සෙල්ලිපි වල හඳුන්වයි.
■ නායක හිමියන් යටතේ සිටි භික්ෂූන් "අන්තේවාසික "යනුවෙන් හැඳින්වෙයි.
උදා - අනුරාධපුරයේ මහ ඇළගමුවේ ලෙන් ලිපියක තිස්සරක්ඛිත නම් තෙරුන්ගේ අන්තේවාසික පුස්ස නැමැත්තෙකු ගැන සඳහන් වෙයි.
■ නායක හිමියන් - ථෙර
■ ශිෂ්‍ය හිමියන් - සදිවිහරිය ( සද්ධිවවිහාරික - සමීපයේ වාසය කරන්නා )
■ ධර්මය මතකයේ තබාගත් - භානක වරු
( දීඝ නිකාය මතකයේ තබාගත් - දීඝ භානක සංයුක්ත නිකාය මතකයේ තබාගත් - සංයුක්ත භානක )

## කඨින උත්සව පැවැත්වීම

■ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හැලඹගල නම් ස්ථානයේ සෙල්ලිපියක වසවසික යන පදය දැක්වෙයි.
උදා - කුරුණෑගල කොතලකිඹියාව ( වසවසික සහඨක ) උත්තිය නම් තෙරෙුන් කෙනෙකුට ඥාතින් විසින් කඨින චීවරයක් දුන් බවට එහි සඳහන් වෙයි.

## වෙනත් ආගම්

### හින්දු ආගම

■ සොත්ථි ශාලා නමින් එකල ගොඩනැගිලි ඉදිවී ඇත.
■ ඒවා බ්‍රාහ්මණයින් පූජාවිධි පැවැත්වූ ස්ථාන ලෙස හැඳින්වෙයි.
■ සිවිකාශාලා යනුවෙන්ද මහාවංශ ටීකාවෙහි දැක්වෙයි.
■ ශිව දෙවියන් වන්දනා කර ඇතිබව තොරතුරු හෙලිවෙයි.
■ ශිව ලිංගය තැන්පත් කළ දේවාල මෙරටින් හමුවෙයි.
උදා- අංක 01 ශිව දේවාලය
අංක 02 ශිව දේවාලය
■ මාතොට වරායට සමීපව තිරුකේශ්වරම් දේවාලය ඉදිවී ඇත.
■ ගෝකණ්ණ තිත්ථ වරායට සමීපව කෝණේශ්වරම් දේවාලය ඉදිවී ඇත.
■ දමෙඩ යනුවෙන් සෙල්ලිපි වල දෙමළ ජනතාව හඳුන්වා ඇත.

## කතෝලික ආගම

■ කුරුසයක් සටහන් කළ ගල් පුවරුවක් අනුරාධපුරයෙන් හමුවෙයි.
■ එය කතෝලික ආගමේ නෙස්ටෝරියානුවන්ට අයත් එකක් ලෙස සැලකෙයි.
■ පර්සියාවේ ව්‍යාප්ත වූ මෙය වෙළඳ සබඳතා මත ලංකාවට පැමිණ ඇත.
■ තවත් සමහරු පවසන්නේ පෘතුගීසින්ගේ සමයේ මෙරටට පැමිණ ඇති බවයි.
■ කොස්මස් ඉන්ඩිකොප්ලේටස් අනුරාධපුරයේ සිටි පර්සියානු වෙළඳ කණ්ඩායමක් ගැන සඳහන් කරයි.

## ඉස්ලාම් ආගම

■ අරාබි භූගෝල විද්‍යා ග්‍රන්ථයක් වූ කිතබ් අල් මස්ලික්වාල් මමාලික් කෘතියේ සෙරන්ඩිප් යනුවෙන්
ලංකාව හඳුන්වා ඇත.
■ වෙළඳාම මුල්කරගෙන මෙරට ඉස්ලාම් ආගම ව්‍යාප්ත විය.

## අපේ අතීත අධ්‍යාපනය

■ බෞද්ධ ආයතනය මුල්කරගෙන අධ්‍යාපන ආයතන බිහිවිය.
■ භික්ෂූන් වහන්සේලා ප්‍රධාන වශයෙන් ගුරුවරු විය.
■ සිංහල , සංස්කෘත , පාලි , ප්‍රාකෘත බාෂා ඉගැන්විය.
උදා - බුද්ධගෝෂ හිමි එලෙස අධ්‍යාපනය සඳහා මෙරටට පැමිනි භික්ෂූන් වහන්සේ නමකි.

## අතීතයේ රසාස්වාදය

■ එදා කවියා සහ රසවින්දනය පිළිබඳ සීගිරිය කැටපත් පව්ර ආශ්‍රිතව කුරුටු ගීත ඇසුරින් පැහැදිලි වෙයි.
■ දැනට කුරුටු ගීත **600** ක් පමණ සොයාගෙන ඇත.

- කිරින්ද ගලේ ලිපිය

අපරිමිත ලොකහි - බුධ සම නති
අඨාන පරම දුලබෙ - සවනුතෙ පතෙ
අනුතරෙ සතෙ - මහ සරණෙ
ලොකවක බුධ නම සයබු - මෙගලහි විහරෙ
නක උවරජ නම - බුධසරණෙ ගතෙ
මිචදිටික බිදිය යහමග පරයන භුතෙ

අර්ථය
අපරිමිත මෙලොව - බුදුන් සම සරණක් නැත
එහිමි සැම තැනය - එසම වනු දුලබ දෙයකි.
මහ සරණකි - කිසිවෙකුට නොදෙවෙනි
තමාම සියල්ල දත් එහිමි - ලොවටම ඇසකි
මිසදිටුකම අතැර - යහමග යනු රිසිව

**මේගලේ විහාරෙදි - බුදු සරණ වැළඳගති නාග උපරජ තෙම**
**( වසර 2000 පමණ පැරණි කවියක් වන මෙය කිරින්ද විහාරයේ ගල් පර්වතයක සටහන් කර ඇත.)**

**විජු රක්බෝ පැවිජ්ජන් ලී මෙගී**
**නෙලෙන් වී පිරිපත**
**නළල කෙහෙ පිටිහි හුණ**
**මලදම ගැනෑ විසිර**
**බියපත් වැ අප බෙයඳ නැගියෙ**

**අර්ථය - වජ්‍ර අග්ගබෝධි පැවිද්දා විසින් ලියූ ගීතයයි.මේ පර්වතය නගින විට සුළඟින් අපට බාදා ඇති විය.නළලෙහි වූ කේස්රොද සුළඟ නිසා පිටට වැටිනි.ගෙලෙහි පැළඳ සිටි මල්මාලයද විසිර ගියේය.අපි ඉන් බියට පත් වුනෙමු. ( සීගිරි කුරුටු ගිතයකි.)**